**නවගත්තේගම ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2015 අප්‍රේල් 10 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 29 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
--------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ දී ආරම්භකර තිබූ පානීය ජල ව්‍යාපෘතියකට පරිත්‍යාග වශයෙන් ලබා දී තිබුණු ජල පිරිපහදුව හා ඉලෙක්ට්‍රෝඩ පිරිසිදු කිරීමේ යන්ත්‍රයෙහි වටිනාකම වූ රු.1,042,000 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පළාත් පාලන අමාත්‍යාංශයෙන් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ ෆෝටෝන් ටිපර් රථයේ වටිනාකම ආගණනය කර ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) වටිනාකම රු.656,842 ක් වූ කුට්ටිගල් නිෂ්පාදනාගාරයෙහි වටිනාකම ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් දැයට කිරුළ සංවර්ධන ව්‍යාපෘතිය මගින් 2014 වර්ෂයේ ඉටුකල කර්මාන්තයක් වෙනුවෙන් ලැබිය යුතු රු.160,000 ක ප්‍රග්ධන ආධාරය ගිණුම්වලින් අත්හැරීම නිසා එම වටිනාකමින් ණයගැතියන්ට හා ණය හිමියන්ට වන බලපෑම ද ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඉ) 2014 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පැවති නල ලිං උපකරණ වර්ග 5ක විෂයයන් 44 ක් හා විදුලි උපකරණ වර්ග 2ක විෂයයන් 38ක වටිනාකම ආගණනය කර ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

(ඊ) මහා මාර්ග අමාත්‍යාංශයෙන් 2013 වර්ෂයේදි ලද රු.8,483,971 ක් වු ප්‍රාග්ධන ආධාර ණයගැතියන්ට හිලව් නොකිරීම නිසා, එම වටිනාකමින් වර්ෂයේ අතිරික්තය හා ණයගැතියන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) කොන්ක්‍රීට් කුට්ටි ගල් අවසන් තොගයේ වටිනාකම වු රු.625,600 ක් ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබීමෙන්, එම ප්‍රමාණයෙන් ජංගම වත්කම් හා අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි.

## 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.12,388,339ක් විය. අවුරුදු 03 කට වැඩි කාලයක් අයකර නොගත් හිඟ කුලී ආදායම රු.21,000 ක් වු අතර, රු.8,483,972 ක් වු ආදායම් ණයගැති ශේෂ මහා මාර්ග අමාත්‍යාංශයෙන් වර්ෂය තුළ ලැබී තිබුණද, නිවැරදිව ගිණුම්ගත නොකිරීම නිසා ඉතිරිව තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට සභාව විසින් බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතුව තිබු ගිණුම්වල එකතුව රු.6,246,895 ක් විය.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබු සේවක ණය අත්තිකාරම්වල එකතුව රු.1,626,410 ක්ව තිබුණි.

## 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

ගිණුම් විෂයයන් 04 කට අදාලව එකතුව රු.33,686,228 ක් වු වත්කම් හා වගකීම් ශේෂ සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

# 2. මුල්‍ය සමාලෝචනය

----------------------

## 2.1 මුල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශයන්ට අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වු පුනරාවර්තන වියදම රු.3,215,036 ක් වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වු පුනරාවර්තන වියදම රු.845,516 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුළ පිළිවෙලින් රු.39,954,010 ක් හා රු.13,079,469 ක් වු ප්‍රාග්ධන ආධාර හා රු.26,348,370 ක් හා රු.13,920,775 ක් වු මුලධන වියදම් ගණන් බැලීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා රු.10,390,604 ක අතිරික්තයක් ඇති වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,686,822 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයෙහි මුල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,077,426 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

---

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් හා සත්‍ය ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2014 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| බදුකුලි | 1,557 | 814 | 743 | 1,687 | 720 | 967 |
| බලපත්‍ර ගාස්තු | 125 | 55 | 70 | 141 | 100 | 41 |
| උසාවි දඩ | 2,040 | 776 | 1,264 | 2,436 | 2,042 | 394 |
| වෙනත් | 2,887 | 396 | 2,491 | 2,083 | 507 | 1,576 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂයේ ආදායම් අයකර ගැනීම්, ඇස්තමේන්තුගත ආදායමින් සියයට 53 ක් ව තිබූ අතර, එය සමාලෝචිත වර්ෂයේ දී සියයට 31 ක අගයක් ගෙන තිබීමෙන් සියයට 22 ක පසුබෑමකට ලක්ව තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ආදායම හා සත්‍ය ආදායම අතර, විචලනය සියයට 47 ක් හා සියයට 69 ක්ව තිබුණි. ඒ අනුව, ආදායම් ඇස්තමේන්තු සැකසීමේ දී අධිඇස්තමේන්තු කිරීමක් සිදුව තිබුණි.

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---

2014 අගෝස්තු සිට 2014 දෙසැම්බර් දක්වා පුත්තලම මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලැබිය යුතුව තිබූ රු.388,207 ක උසාවි දඩ ආදායම ගිණුම්ගත කර නොතිබුණු අතර ඉකුත් වර්ෂයේ මැයි මාසයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා වයඹ පළාත් සභාවෙන් අයවිය යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ක්‍රීට් කුට්ටි ගල් නිෂ්පාදනය සඳහා සමාලෝචිත වර්ෂයේ රු.700,000 ක ප්‍රාග්ධනයක් සභා අරමුදලින් යෙදවීමට අපේක්ෂිත වුවද, ඒ සඳහා සභා අරමුදලින් සිදුව ඇති දායකත්වය සියයට 67 ක් හෙවත් රු.471,728 ක් පමණි.

(ආ) වර්ෂ ගණනාවක සිට හිඟව පවතින රු.21,000 ක ගොඩනැඟිලි කුලී ආදායම් අයකරගෙන නොතිබුණි.

(ඇ) සභාව ප්‍රමාණවත් ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හෝ නව ආදායම් උත්පාදිත මාර්ග කෙරෙහි යොමුවීමක් සිදුකර නොතිබුණි.

(ඈ) අභ්‍යන්තර විගණන සැලසුමට අනුව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ සභාවේ ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 80 ක් වූ අතර, සත්‍ය වියදම රුපියල් මිලියන 26 ක් විය. ඒ අනුව, එහි විචලනය රුපියල් මිලියන 54 ක් විය. එනම්, ප්‍රාග්ධන වියදම සියයට 67 කින් අධි ඇස්තමේන්තු කිරීමක් සිදුකර තිබුණි.

### 3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

---

සභාව සතු රු.332,500ක් වටිනා මිනි කුබෝටා ට්‍රැක්ටරය හා එම ට්‍රේලරය වර්ෂ 10 කට අධික කාලයක් තුළ නිෂ්ක්‍රීයව තිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

---

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 49 ක් වූ අතර, එහි තථ්‍ය සංඛ්‍යාව 52 ක් විය. එනම්, තනතුරු වර්ග දෙකක සේවකයින් 11 දෙනෙකුගේ අතිරික්තයක් ද, තනතුරු වර්ග තුනකට අදාලව සේවකන් 08 දෙනෙකුගේ අතිරික්තයක් ද දක්නට ලැබුණි.

(ආ) වර්ෂ ගණනාවක් තිස්සේ සභාවේ ලේකම් තනතුර පුරප්පාඩුව පැවති අතර, එම තනතුරේ වැඩ බැලීම් සංවර්ධන නිලධාරී (ආදායම් ප්‍රවර්ධන) විසින් සිදු කරමින් තිබුණි.

(ඇ)	සභාවට අනුමත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 07 ක් වූවත්, නිලධාරීන් 07 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

**4. පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ)	ගිණුම්කරණය
(ආ)	ආදායම් පරිපාලනය
(ඇ)	වත්කම් කළමනාකරණය